## ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය - 2013

-----------------------------------

ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ හා එහි පරිපාලිතයන්හි 2013 දෙසැම්බර් දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශන හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශන, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශන සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශන සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනත සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. පරිපාලිතයන්හි මූල්‍ය ප්‍රකාශන අදාළ පරිපාලිතයන්හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත්කරන ලද ප්‍රසිද්ධ වෘත්තියෙහි නියැලි වරලත් ගණකාධිකාරී සමාගමක් විසින් විගණනය කරන ලදී.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-----------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර ප්‍රමිතිවලට **(ISSAI 1000-1810)** අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

-------------------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

----------------

### 2.1 තත්ත්වාගණනය කළ මතය - සමූහය

------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ සහ පරිපාලිත සමාගම්වල මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා ඒවායේ මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**තත්ත්වාගණනය කළ මතය -අධිකාරිය**

-------------------------------------------

මෙම වාර්තාවේ 2.2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 සමූහයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-----------------------------------------------

#### 2.2.1 මූල්‍ය ප්‍රකාශන ඒකාබද්ධ කිරීම

-----------------------------------

අධිකාරියේ සහ එහි පරිපාලිත සමාගම් 05 ක මූල්‍ය ප්‍රකාශන ඒකාබද්ධ කර ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණි. කෙසේ වුවද මෙම කාර්යය සඳහා පරිපාලිත සමාගම් 03 ක් පමණක් ඔවුන්ගේ විගණිත මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණි. පරිපාලිතයන්හි නම් හා අයිතිය පහත පරිදි වේ.

| පරිපාලිතයේ නම | අයිතියේ ප්‍රතිශතය |
|---|---|
| --------------------- | ---------- |
| සීමාසහිත මහවැලි කන්සල්ටන්සි බියුරෝ (පුද්ගලික) සමාගම | 100 |
| සීමාසහිත නැචුරල් රිසෝසස් මැනේජ්මන්ට් සර්විසස් (පුද්ගලික) සමාගම | 100 |
| සීමාසහිත මහවැලි ඉන්ජිනියරින් සර්විසස් (පුද්ගලික) සමාගම | 100 |
| සීමාසහිත මහවැලි වෙන්චර් කැපිටල් (පුද්ගලික) සමාගම | 100 |
| සීමාසහිත මහවැලි ලයිව්ස්ටොක් ඇන්ඩ් ඇග්‍රෝ එන්ටර්ප්‍රයිසස් (පුද්ගලික) සමාගම | 100 |

#### 2.2.2 අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

-----------------------------------------------------

##### 2.2.2.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

--------------------------

ගොවිපොළ 18 ක හා වැඩපොළ 2 ක ආදායම් හා වියදම් ගිණුම් පිළියෙල කිරීම සඳහා යොදාගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

##### 2.2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

මූලධන වියදම් රු.59,572,775 ක් පුනරාවර්තන වියදම් ලෙස ගිණුම්ගත කර තිබූ බව විගණන නියැදි පරීක්ෂණවලදී අනාවරණය විය. එබැවින් සමාලෝචිත වර්ෂය සඳහා ජංගම නොවන වත්කම් අඩුවෙන් දක්වා තිබූ අතර, වර්ෂය සඳහා ඌනතාවය එම මුදලින් වැඩියෙන් දක්වා තිබුණි. තවද මෙම වත්කම් සඳහා සමාලෝචිත වර්ෂය තුළදී ක්ෂය ප්‍රතිපාදනය කර නොතිබුණි.

**2.2.2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2013 දෙසැම්බර් 31 දිනට වෙළඳ හා වෙනත් ලැබිය යුතු ශේෂය රු.මිලියන 1,001.8 ක් වූ අතර 2012 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.මිලියන 893.4 ක් විය. පෙර වර්ෂය සමඟ සැසඳීමේදී වෙළඳ හා වෙනත් ලැබිය යුතු ශේෂය වැඩිවීම රු.මිලියන 108.4 ක් හෙවත් සියයට 12 ක් විය. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ලැබිය යුතු ශේෂයන්ගෙන් රු.455,958,976 ක් හෙවත් සියයට 93 ක් කුලී ආදායම වූ අතර ඒ අතරින් එකතුව රු.124,041,067 ක්, රු.116,200,208 ක් හා රු.110,694,675 ක් පිළිවෙලින් **'සී'** කලාපයෙන්, වික්ටෝරියා - කොත්මලේ සහ **"එච්"** කලාපයෙන් ලැබිය යුතු ඒවා විය.

(ආ) විගණනය සඳහා ඉදිරිපත් කරන ලද කාල විශ්ලේෂණය අනුව, කුලීකරුවන්ගෙන් ලැබිය යුතු රු.137,995,000 ක් හා රු.53,850,000 ක් පිළිවෙලින් වර්ෂ 5 කට වැඩි කාලයක් සහ වර්ෂ 3 හා 5 අතර කාලයක් හිඟ හිට පැවති බව අනාවරණය විය. එම ශේෂ අයකර ගැනීම සඳහා සමාලෝචිත වර්ෂය අවසානය දක්වාත් අධිකාරිය විසින් කඩිනම් පියවරක් ගෙන නොතිබුණි.

(ඇ) වර්ෂ 5 කට වැඩි කාලයක් සහ වර්ෂ 3 හා 5 අතර කාලයක් ගිණුම්වල පැවතුණු පිළිවෙලින් රු.344,**272** ක් හා රු.779,407 ක් වූ වැඩ පූර්ව අත්තිකාරම් අයකර ගැනීමට 2013 දෙසැම්බර් 31 දක්වාත් පියවර ගෙන නොතිබුණි.

(ඈ) මහවැලි ඒකාබද්ධ ව්‍යාපෘතිය- සිස්ටම් **'ජී'** සහ මහවැලි ප්‍රතිව්‍යුහගත කිරීම හා පුනරුත්ථාපන ව්‍යාපෘතිය 2005 වර්ෂයේදී නිම කර තිබුණද, පිළිවෙලින් එකතුව රු.2,700,000 ක් හා රු.4,200,000 ක් වූ හිඟ වැඩ පූර්ව අත්තිකාරම් 2013 දෙසැම්බර් 31 දක්වාත් අධිකාරිය විසින් අයකර ගැනීමෙන් තොරව ගිණුම්වල හිඟහිට පැවතුණි.

(ඉ) 2014 ජනවාරි 29 දිනැති හා 2014 ජනවාරි 31 දිනැති අංක ඒසීසීටීඑස්/සීඔආර්පී/ඩීආර්එස්/2014 දරන ලිපිවලට අනුව රු.14,152,690 ක මුදලක් නීතිපති දෙපාර්තමේන්තුවට නෛතික ගාස්තු ලෙස ගෙවිය යුතු විය. එසේ වුවද මේ සම්බන්ධයෙන් උපචිත වියදම් ලෙස රු.4,135,000 ක මුදලක් පමණක් අධිකාරිය විසින් ප්‍රතිපාදනය කර තිබුණි.

**2.2.2.4 පැහැදිලි නොකළ වෙනස්කම්**

පහත සඳහන් වෙනස්කම් සඳහා හේතු විගණනයට පැහැදිලි කර නොතිබුණි.

| | **විෂයය** | **මූල්‍ය ප්‍රකාශන අනුව මුදල** | **අදාළ උපලේඛන/ලෙජර් ගිණුම් අනුව මුදල** | **වෙනස** |
|---|---|---|---|---|
| | | රු. | රු. | රු. |
| 1. | නේවාසික කළමනාකරු කාර්යාල 10 ක කුලී ආදායම | 247,148,000 | 166,910,000 | 80,238,000 |
| 2. | ගොවිපොළ ආදායම | | | |
| | **RPM - B** | 858,000 | 10,370,000 | 9,**5**12,000 |
| | **RPM -** වලව | - | 8,778,000 | 8,778,000 |
| 3. | ප්‍රත්‍යාගණන අතිරික්තය | 793,820,000 | 884,118,000 | 90,298,000 |

**2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම**

පහත සඳහන් එක් එක් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| ගිණුම් විෂයයන් | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|
| | රු.මිලියන | |
| බැංකු ශේෂ | 122.84 | බැංකු සනාථ කිරීම් |
| ගොවිපොළ නිෂ්පාදන විකුණුම් | 19.88 | විස්තරාත්මක උපලේඛන |
| ලැබිය යුතු කුලී | 380.35 | දත්ත පදනමක් හෝ විධිමත්ව පවත්වා ගනු ලැබූ ලේඛනයක් |
| | 523.07 | |

**2.3 නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

පහත සඳහන් අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| **(i)** මුදල් රෙගුලාසි 104(1)(ආ) | වාහන දෙකකට සිදුවූ විශාල අනතුරුවලට අදාළව, ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා විසින් පත්කරන ලද කමිටුවක් මඟින් මූලික පරීක්ෂණ පවත්වා නොතිබුණි. මෙම අනතුරු වලින් දරන ලද සම්පූර්ණ හානිය රු.1,330,795 ක්වූ අතර ඉන් රු.537,250 ක් පමණක් රක්ෂණ සමාගමෙන් අයකර තිබුණි. |
| **(ii)** මුදල් රෙගුලාසි 110(1) | පාඩු හා හානි වාර්තා කිරීම සඳහා ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | |
| **VII** පරිච්ඡේදයේ 12.5.1 වගන්තිය | අධිකාරියේ අනුමත කාර්ය මණ්ඩලය සඳහා මාධ්‍ය නිලධාරි තනතුරක් නොවුවද, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ නිලධාරියකු ද්වීතියනය පදනම මත මාධ්‍ය නිලධාරී ලෙස බඳවා ගෙන තිබුණි. පසුව 2011 ජනවාරි සිට පූර්ණ කාලීන පදනම මත එම නිලධාරියා වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශයට මුදාහැර තිබුණි. කෙසේවුවද 2011 ජනවාරි සිට 2013 සැප්තැම්බර් දක්වා කාල |

පරිච්ඡේදය සඳහා ආයතන සංග්‍රහයේ විධිවිධානවලට පටහැනිව ඔහුට මාසයකට වැටුප් වශයෙන් රු.50,000 ක මුදලක් හා ඉන්ධන දීමනා වශයෙන් රු.480,095 ක් අධිකාරිය විසින් ගෙවා තිබුණි.

## 3 . මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය තුළ අධිකාරියේ හා එහි පරිපාලිතයන්හි මෙහෙයුම් ප්‍රතිඵලය රු.මිලියන 70.58 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.මිලියන 356.84 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.මිලියන 286.26 ක වර්ධනයක් දැක්වුණි. මෝටර් වාහන ප්‍රත්‍යාගණනය හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළ ක්ෂය සඳහා ප්‍රතිපාදනය නොකිරීම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

#### 4.1.1 පරිපාලිත සමාගම් ඇවර කිරීම

අධිකාරියේ පරිපාලිතයන් වන සීමාසහිත මහවැලි වෙන්චර් කැපිටල් (පුද්ගලික) සමාගම සහ සීමාසහිත මහවැලි ඉංජිනේරු සේවා (පුද්ගලික) සමාගම ඇවර කිරීම සඳහා 2013 නොවැම්බර් 23 දින අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා දී තිබුණි. ඒ අනුව සීමාසහිත මහවැලි ඉංජිනේරු සේවා (පුද්ගලික) සමාගම සමාලෝචිත වර්ෂයේ ඇවර කර තිබූ අතර සීමාසහිත මහවැලි වෙන්චර් කැපිටල් (පුද්ගලික) සමාගමේ කටයුතු විසුරුවා හැරීම ක්‍රියාත්මක වෙමින් පවතී.

#### 4.1.2 ඉඩම් සංවර්ධන කටයුතු

අධිකාරියේ ප්‍රධාන සැලැස්ම අනුව, කලාප 14 ක් ඇතුළත සංවර්ධනය කිරීම සඳහා අපේක්ෂිත මුළු භූමි ප්‍රමාණය හෙක්ටයාර් 420,170 ක් විය. කෙසේ වුවද 2013 දෙසැම්බර් 31 දිනට සංවර්ධනය කරන ලද මුළු භූමි ප්‍රමාණය හෙක්ටයාර් 102,528 ක් පමණක් වූ අතර මොරගහකන්ද ව්‍යාපෘතිය, මාදුරු ඔය දකුණ හා කිවුල්ඔය ව්‍යාපෘතිය යටතේ දැනට සංවර්ධනය වෙමින් පවතින භූමි ප්‍රමාණය හෙක්ටයාර් 109,715 ක් වේ. ඒ අනුව හෙක්ටයාර් 207,927 ක් සංවර්ධනය කිරීම සඳහා නිශ්චිත සංවර්ධන සැලසුම් 2013 දෙසැම්බර් 31 දක්වා සකස් කර නොතිබුණි.

#### 4.1.3 සංචාරක බංගලා පාලනය හා පවත්වා ගැනීම

2013 දෙසැම්බර් 31 දිනට අධිකාරිය යටතේ සංචාරක බංගලා 17 ක් විය. අලුත්වැඩියා කටයුතු සඳහා නුවරඑළිය සංචාරක බංගලාව 2011 ජුනි සිට වසා දමා තිබූ අතර 2013 දෙසැම්බර් 31 දක්වා කිසිදු අලුත්වැඩියාවක් ආරම්භ කර නොතිබුණි. 2013 වර්ෂය සඳහා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ප්‍රකාරව, සංචාරක බංගලාවලින් ලැබුණු මුළු ආදායම රු.මිලියන 5.281 ක් වූ අතර සමාලෝචිත වර්ෂය තුළ සංචාරක බංගලා නඩත්තුව හා පාලනය සඳහා ප්‍රමාණවත් අවධානයක් යොමු කර නොතිබුණු බවද නිරීක්ෂණය විය.

## 4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2013 ජනවාරි සිට ජූලි දක්වා කාලපරිච්ඡේදය තුළ රු.605,962 ක් වටිනා ලිපිද්‍රව්‍ය හා වෙනත් විවිධ විෂයයන් මිලදී ගැනීම සඳහා දිගන ආරක්ෂක නිලධාරි විසින් ප්‍රසම්පාදන පරිපාටිය අනුගමනය කර නොතිබුණු බව විගණන නියැදි පරීක්ෂණයේදී අනාවරණය විය.

(ආ) වලව විශේෂ ප්‍රදේශයේ නේවාසික ව්‍යාපෘති කළමනාකරු කාර්යාලයෙහි ඇස්තමේන්තුගත වාර්ෂික කුලිය හා 2013 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු කුලිය පිළිවෙලින් රු.මිලියන 20.6 ක් හා රු.මිලියන 67.5 ක් විය. කෙසේ වුවද තථ්‍ය අයකර ගැනීම පිළිවෙලින් රු.මිලියන 5.46 ක් හා රු.මිලියන 4.7 ක් විය. එබැවින් ආදායම එකතු කරගැනීමේ ප්‍රගතිය සියයට 26.6 ක් හා සියයට 6.9 ක් වූ අතර ප්‍රධාන ණයගැතියන් 8 දෙනෙකුගෙන් ලැබිය යුතු හිඟ ශේෂය රු.මිලියන 74.13 ක් විය.

(ඇ) පොල්ගොල්ල, කොත්මලේ, බෝවතැන්න, මාපාකඩ, මාදුරුඔය හා වික්ටෝරියා ජලාශ රක්ෂිත ප්‍රදේශවල අනවසර පදිංචිකරුවන් 655 දෙනෙකු සිටි බව අනාවරණය විය. එහෙත් එම අනවසර පදිංචිකරුවන් ඉවත් කිරීමට හා අනවසර පදිංචිකරුවන්ගේ තවදුරටත් පැමිණීම වළක්වා ගැනීමට අධිකාරිය අසමත් වී තිබුණි.

(ඈ) "එල්" පද්ධතියට අදාළව රු.220,000 ක් වටිනා තොග ඌනතාවය ගිණුම්වලට ගෙන නොතිබුණි.

(ඉ) වර්ෂ කිහිපයක සිට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.1,317,000 ක් වටිනා යල්පැන ගිය තොග අපහරණය කිරීමට පියවර ගෙන නොතිබුණි.

(ඊ) ඉඩම් අංශයේ වාර්තාවලට අනුව, ඉඩම් කට්ටි 5,177 ක් බාහිර පාර්ශවයන් විසින් අනවසරයෙන් අල්ලා ගෙන තිබුණි. මෙම ඉඩම් පිළිබඳ නෛතික ක්‍රියාවලිය ප්‍රමාද වීම හේතුවෙන් ඉපැයිය හැකි ආදායම අධිකාරියට අහිමි වී තිබුණි.

(උ) 1982 වර්ෂයේදී සීමාසහිත මහවැලි ලයිව්ස්ටොක් හා ඇග්‍රෝ එන්ටර්ප්‍රයිසස් සමාගමේ කොටස් මිලියන 1 ක කරන ලද රු.මිලියන 10 ක ආයෝජනයෙන් අධිකාරියට කිසිදු ලාභාංශයක් ලැබී නොතිබුණ අතර 1989 වර්ෂයේදී සීමාසහිත මහවැලි වෙන්චර් කැපිටල් (පුද්ගලික) සමාගමේ කරන ලද රු.මිලියන 9.8 ක මුදල් ආයෝජනයෙන් කිසිදු පොලියක් ලැබී නොතිබුණි.

(ඌ) 1982 වර්ෂයේදී අධිකාරිය විසින් මහවැලි ලයිව්ස්ටොක් හා ඇග්‍රෝ එන්ටර්ප්‍රයිසස් (පුද්ගලික) සමාගමට නිරාවිය හා කලන්කුට්ටියෙහි ඉඩම් දෙකක් ඔවුන්ගේ ප්‍රයෝජනය සඳහා ලබා දී තිබුණි. කෙසේ වුවද මෙම පරිපාලිතයෙන් බදු කුලිය අයකර ගැනීමට අධිකාරිය මේ දක්වා කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

## 4.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

---------------------------------

1978 අංක 3 දරන ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය පනතේ, 26(ඊ) ඡේදයේ විධිවිධාන අනුව අධිකාරියට ලැබෙන සියලු ප්‍රදානයන් අධිකාරියේ පොදු අරමුදලට බැර කළ යුතුය. අධිකාරිය විසින් ලංකා බැංකුව ඇඹිලිපිටිය ශාඛාවේ "මහවැලි ස්පොට්ස් සොසයටි " නමින් වෙනම බැංකු ගිණුමක් (ගිණුම් අංකය

2297822) විවෘත කර තිබුණද 2013 දෙසැම්බර් 31 දිනට එම ගිණුමේ ශේෂය අධිකාරියේ ගිණුම්වලට ගෙන නොතිබුණි.

**4.4 වෙනත් ආයතනවලට මුදාහරින ලද වත්කම්**

**-----------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.9 ඡේදයට පටහැනිව කොත්මලේ පුහුණු මධ්‍යස්ථානයේ රු.26,030,780 ක් වටිනා ගොඩනැගිලි වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශයට මුදා හැර තිබූ අතර මෝටර් වාහන 54 ක් බාහිර පාර්ශවයන් වෙත මුදා හැර තිබුණි.

(ආ) මහවැලි අධිකාරියේ ගබඩා තුනක් සහ ගබඩා 12 කින් සමන්විත ගොඩනැගිල්ලේ තවත් කොටසක් වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය හා ජල සම්පත් සැලසුම් ව්‍යාපෘතිය විසින් උපයෝජනය කර තිබුණද ඒ සඳහා කුලී අයකර ගෙන නොතිබුණි.

(ඇ) අධිකාරිය නමට ඉඩමේ අයිතිය අත් කරගැනීමෙන් තොරව ජාවත්තේ පිහිටි හෙක්ටයාර 0.99 ක ප්‍රමාණයක් වූ ඉඩමක රු.73,771,200 ක් වැයකර ගොඩනැගිලි සංකීර්ණයක් අධිකාරිය විසින් ඉදිකර තිබුණි. මෙම ගොඩනැගිලි සංකීර්ණය (වර්ග අඩි 16,000) රජයේ ආයතන 11 ක් විසින් උපයෝජනය කර තිබුණද 2013 දෙසැම්බර් 31 දක්වා එම ආයතනවලින් කිසිදු කුලියක් අයකර ගැනීමට අධිකාරිය අසමත් වී තිබුණි. තවද 2010 දෙසැම්බර් සිට මෙම ගොඩනැගිල්ල උපයෝජනය කරන වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශයෙන්, පියොරි කන්සල්ටන්සි සමාගමෙන් හා උතුරු මැද පළාත් උපදේශක ව්‍යාපෘතියෙන් 2010 දෙසැම්බර් සිට 2013 දෙසැම්බර් දක්වා කාල පරිච්ඡේදයට අදාළව රු.10,190,197 ක් වූ විදුලි, ජලය හා සනීපාරක්ෂක සේවා ගාස්තු අධිකාරිය විසින් අයකර ගෙන නොතිබුණි.

**4.5 මානව සම්පත් කළමනාකරණය**

**-------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2013 දෙසැම්බර් 31 දිනට අධිකාරියේ අනුමත සේවක සංඛ්‍යාව 4,614 ක් වූ අතර එදිනට තථ්‍ය සේවක සංඛ්‍යාව 4,298 ක් වූ හෙයින් 2013 දෙසැම්බර් 31 දිනට පුරප්පාඩු 438 ක් පැවතුණි. තවද සමාලෝචිත වර්ෂය අවසානයට ප්‍රාථමික මට්ටමේ අතිරික්ත සේවක සංඛ්‍යාව 122 ක් විය.

(ආ) අධිකාරියේ බඳවා ගැනීම් යෝජනා ක්‍රමයේ දක්වා ඇති පරිදි අවශ්‍ය සුදුසුකම් හා පළපුරුද්ද නොමැති ජ්‍යෙෂ්ඨ මට්ටමේ කළමනාකරුවන් 4 දෙනෙකු 2012 හා 2013 වර්ෂවලදී බඳවා ගෙන තිබුණි.

**(i)** අනුමත කාර්ය මණ්ඩලයේ අධ්‍යක්ෂ (ලේකම් කාර්යාලය) තනතුර සඳහා වෙන්කිරීමක් කර නොතිබුණද එම තනතුර සඳහා නිලධාරිණියක 2011 දී පත්කර තිබුණි. පළකරන ලද පුවත්පත් නිවේදනය ප්‍රකාරව එම තනතුර සඳහා වර්ෂ 15 ක පළපුරුද්දක් අවශ්‍ය වුවද එම අවශ්‍ය පළපුරුද්ද ඇය විසින් සපුරා නොතිබුණි. ඉන් පසුව අධිකාරියේ බඳවාගැනීම් හා උසස් වීම් යෝජනා ක්‍රමයේ අනුමත කරන ලද පරිදි එම සමාන සුදුසුකම් හා පළපුරුද්ද අවශ්‍ය වූ අධ්‍යක්ෂ (ප්‍රධාන කාර්යාලය - මෙහෙයුම්) තනතුරට මෙම නිලධාරිණිය පත්කර තිබුණි.

(ii) අධ්‍යක්ෂ (මානව සම්පත් හා ආයතනික සහාය) තනතුර සඳහා අවශ්‍ය පළපුරුද්ද නොමැති වෙනත් නිලධාරියෙකු 2011 වර්ෂයේදී බඳවා ගෙන තිබුණි.

(iii) අධ්‍යක්ෂ (මහවැලි කේන්ද්‍රය) තනතුර අවශ්‍ය සුදුසුකම් හා පළපුරුද්ද නොමැතිව කොන්ත්‍රාත් පදනම මත පුරවා තිබුණි.

(iv) අධ්‍යක්ෂ (පිරිස්) තනතුර සඳහා I ශ්‍රේණියේ සුදුසුකම අවශ්‍ය වුවද ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III ශ්‍රේණියේ නිලධාරියෙකු රේඛීය අමාත්‍යාංශයේ ලේකම් විසින් පත්කර තිබුණි. තවද එම තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම් නොමැතිව 2014 ජනවාරි 09 දින සිට මෙම නිලධාරියා නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පරිපාලන හා මුදල්) තනතුරට පත්කර තිබුණි.

## 5. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

### 5.1 සංයුක්ත සැලැස්ම

2012 වර්ෂයේදී 2012 සිට 2016 දක්වා වූ වර්ෂ 05 ක් සඳහා සංයුක්ත සැලැස්මක් සකස් කර තිබුණි. "මහින්ද චින්තන දස අවුරුදු සැලැස්ම " අනුව වාරි අංශය විසින් ළඟා කරගත යුතු ඉලක්කයන් පිළිබඳව සංයුක්ත සැලැස්මේ සඳහන් කර තිබුණද, එම ඉලක්කයන් ඉටුකර ගැනීම සඳහා අනුගමනය කරන උපාය මාර්ග දක්වා ඒවා ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර නොතිබුණි.

### 5.2 ක්‍රියාකාරී සැලැස්ම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා සකස් කර තිබූ ක්‍රියාකාරී සැලැස්මේ ඒ ඒ කාර්යයන් සඳහා වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන නොතිබුණි.

(ආ) ආයතනික සහාය හා මානව සම්පත් සංවර්ධනය යටතේ ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් රු.1,813,000 ක් වටිනා වැඩසටහන් 81 ක් සමාලෝචිත වර්ෂය තුළ ක්‍රියාත්මක කර නොතිබූ බව විගණන නියැදි පරීක්ෂණවලදී අනාවරණය විය.

(ඇ) ඉඩම් අංශයේ සමාලෝචිත වර්ෂය සඳහා වූ ප්‍රගති වාර්තාව අනුව, සමස්ත කාර්යසාධනය සියයට 42 ක් පමණක් විය. ප්‍රායෝගික නොවූ ඉලක්ක සකස් කිරීම සහ අදාළ අංශයන්හි අකාර්යක්ෂමතාවයන් දුර්වල කාර්යසාධනය සඳහා හේතු වූ බවද තවදුරටත් නිරීක්ෂණය විය.

### 5.3 අභ්‍යන්තර විගණනය

2010 නොවැම්බර් 30 දින සිට අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණක) තනතුර පුරප්පාඩුව පැවති අතර, 2014 දෙසැම්බර් 31 දක්වාම එම තනතුරට සුදුසු නිලධාරියකු බඳවා ගෙන නොතිබුණි.

### 5.4 විගණන හා කළමනාකරණ කමිටු

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4.1 වගන්තිය ප්‍රකාරව සෑම මාස 03 කට වරක් කමිටු රැස්වීම් පැවැත්විය යුතු වුවත් 2013 වර්ෂය තුළ විගණන කමිටු රැස්වීම් 02 ක් පමණක් පවත්වා තිබුණි.

### 5.5 ප්‍රසම්පාදන සැලැස්ම

2013 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර තිබූ නමුත්, එහි ප්‍රගතිය ප්‍රමාණවත් පරිදි නියාමනය කර නොතිබුණි.

**5.6 අයවැය පාලනය**

සමාලෝචිත වර්ෂය සඳහා අධිකාරියේ අයවැයගත හා තථ්‍ය වියදම අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය. එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

| වියදම | අයවැයගත වියදම | තථ්‍ය වියදම | විචලනය | විචලනය අයවැයගත වියදමේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | |
| ලිපිද්‍රව්‍ය හා මුද්‍රණ | 14,545,000 | 20,583,456 | 6,038,456 | 41.52 |
| වාහන අලුත්වැඩියා හා නඩත්තුව | 28,401,600 | 87,929,898 | 59,528,298 | 209.6 |
| ගොඩනැගිලි හා ව්‍යුහයන් | 10,335,000 | 14,078,078 | 3,743,078 | 36.22 |
| කාර්යාල උපකරණ | 6,325,000 | 8,231,064 | 1,906,064 | 30.14 |

**5.7 නොවිසඳුණු විගණන ඡේද**

මාගේ පෙර වර්ෂවල විගණන වාර්තාවලින් පෙන්වා දෙන ලද විගණන නිරීක්ෂණ 2015 ජුනි 30 දක්වාත් විසඳා නොතිබුණි.

(අ) **'එච්'** කලාපයේ නේවාසික ව්‍යාපෘති කළමනාකරු ඔහුට වෙන්කර තිබූ වාහනය හැර අමතර වාහනයක් 2010 මැයි සිට 2011 දෙසැම්බර් දක්වා උපයෝජනය කර තිබුණි. ආරක්ෂක අංශය විසින් පවත්වා ගෙන යනු ලැබූ ගේට්ටු බලපත්‍ර ලේඛනයට අනුව ඉහත වාහනය ඉහත කාලපරිච්ඡේදය තුළදී කාර්යාල පරිශ්‍රයට පැමිණ නොතිබුණි. එසේ වුවද නේවාසික ව්‍යාපෘති කළමනාකරු විසින් සියලු ගමන් සඳහා ඔහුගේ අත්සන තබා සහතික කර තිබුණි.

වාහනයේ දෛනික ගමන් ආරම්භය තඹුත්තේගම සිට බව වාහනයේ රියදුරු විසින් දක්වා තිබුණද, 2010 පෙබරවාරි සිට 2011 දෙසැම්බර් දක්වා කාලපරිච්ඡේදය තුළ තඹුත්තේගම කාර්යාලය විසින් පවත්වා ගෙන යනු ලැබූ පැමිණීම් හා පිටවීම් ලේඛනයේ ඔහු අත්සන් තබා නොතිබුණි.

කාර්යාලය විසින් වාහනය භාවිතා කර නොතිබුණද කාලපරිච්ඡේදය තුළ මෙම වාහනය අලුත්වැඩියා කිරීම හා ටයර් 04 ක් ප්‍රතිපූර්ණය කිරීම සම්බන්ධයෙන් රු.201,385 ක මුදලක් කාර්යාලය විසින් දරා තිබුණි. මේ සම්බන්ධයෙන් ප්‍රාරම්භක විමර්ශනයක් ආරම්භ කර ඇති බව අධ්‍යක්ෂ ජනරාල් විසින් දන්වා තිබුණි.

(ආ) අධිකරණ නියෝගයක් අනුව, වෙනත් නේවාසික ව්‍යාපෘති කළමනාකාරවරයකු 2011 සැප්තැම්බර් 16 සිට එච් කලාපයේ නේවාසික ව්‍යාපෘති කාර්යාලයට අනුයුක්ත කර තිබුණි. මෙම නිලධාරීන් දෙදෙනා 2011 වර්ෂය තුළ අනුමැතියක් නොමැතිව ලබාගත් ඉන්ධන වල වටිනාකම රු.682,298 ක් විය.

(ඈ) ලංකා විදුලි බල මණ්ඩලයේ මුළු ජල විදුලි බල උත්පාදනයෙන් සියයට 50 ක් පමණ මහවැලි ජලාශ සමඟ සම්බන්ධිතව ඉදිකරන ලද ජල විදුලිබලාගාර විසින් නිෂ්පාදනය කරන අතර පොල්ගොල්ල හා වික්ටෝරියා ජලාශවල වේළි මත විදුලි පහන් සවිකිරීම සම්බන්ධයෙන් අධිකාරිය විසින් 2013 වර්ෂයේදී ලංකා විදුලිබල මණ්ඩලයට විදුලි බිල්පත් ගෙවා තිබුණි. තවද වික්ටෝරියා වේල්ල ඉදිකිරීමේ ආරම්භක අදියරේදී වේල්ලේ විදුලිබල අවශ්‍යතාවය ඉටුකර ගැනීම සඳහා කුඩා ජල විදුලි බලාගාරයක් ඉදිකිරීමට සැලසුම් සකස් කර තිබුණු අතර මෙම කාර්යය සඳහා අවශ්‍ය උපකරණ පළමු ඉදිකිරීම් සමාගම විසින් සපයා තිබුණි. එසේ වුවද එකී ඉදිකිරීම පසුව අත්හැර දමා තිබූ අතර, උපකරණ භාවිතා කිරීමෙන් තොරව විවිධ ස්ථානයන්හි අනාරක්ෂිතව රඳවා තිබුණි. ජලාශ නඩත්තුව සඳහා හා විදුලිබල මණ්ඩලය විසින් පාවිච්චි කරන ජලය සඳහා ගාස්තු නොගෙවන බැවින්, ප්‍රධාන වේළිවල විදුලිබල අවශ්‍යතාවය ගෙවීම් කිරීමෙන් තොරව ලබා ගැනීම සඳහා අධිකාරිය අවධානය යොමු කළ යුතුය.

6. පද්ධති හා පාලන

------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අවධානයට වරින් වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුවේ.

(අ) ඉඩම් බදු දීම
(ආ) වත්කම් කළමනාකරණය
(ඇ) ගොවිපොළ පරිපාලනය
(ඈ) තොග පාලනය
(ඉ) බදු එකතු කිරීම
(ඊ) මෝටර් වාහන පාලනය
(උ) අත්තිකාරම් ගෙවීම
(ඌ) ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම